# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1644/32 – 2010 මාර්තු 12 වැනි සිකුරාදා – 2010.03.12

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/32/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

පී. සුනිල් සිල්වා, නො. 681/20A, කේ. ජේ. පීරිස් මාවත, පට්ටියහන්දිය, කැළණිය

සහ

සිලෝන් ටුබැකෝ කම්පැණි, පී. එල්. සී.,, අංක 178, ශ්‍රීමත් රාමනාදන් මාවත, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය, අතාවුද සෙනෙවිරත්න වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77 හි, ටී. පියසෝම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

අතාවුද සෙනෙවිරත්න,
කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍ය.

2010 මාර්තු මස 09 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/32/2009.

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

පී. සුනිල් සිල්වා, නො. 681/20A, කේ. ජේ. පීරිස් මාවත, පට්ටියහන්දිය, කැළණිය

සහ

සිලෝන් ටුබැකෝ කම්පැණි, පී. එල්. සී,, අංක 178, ශ්‍රීමත් රාමනාදන් මාවත, කොළඹ 15.

අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

සිලෝන් ටුබැකෝ කම්පැණි, පී. එල්. සී. විසින් පී. සුනිල් සිල්වා මහතාගේ සේවය අවසන් කිරීමේ දී, සමාගමේ සේවයෙන් ඉල්ලා අස්වූ සේවකයෙක් වශයෙන් සලකා ඔහුට ලබාදීමට එකඟ වූ මෙහි පහතින් දක්වා ඇති හිමිකම් සම්පූර්ණ වශයෙන් ලබා දී ඇත්ද යන්න හා නොඑසේනම්, පී. සුනිල් සිල්වා මහතාට සමාගම වෙතින් කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳවද වේ.

(1) ස්වේච්ඡාවෙන් සමුගැනීමේ දීමනාව,
(2) අවුරුදු විසිපහ (25) කට වැඩි සේවා කාලය සඳහා ජ්‍යෙෂ්ඨතා ප්‍රදානය,
(3) 2008 වර්ෂය සඳහා ලාභාංශ ප්‍රසාද දීමනාව,
(4) හිඟ වශයෙන් ලැබිය යුතු 2009 පෙබරවාරි, මාර්තු, අප්‍රේල්, මැයි හා ජූනි යන මාස පහ (05) ක වැටුප,
(5) 'දරුවන් සඳහා වන ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය' යටතේ ප්‍රතිලාභ,
(6) වසර දෙක (02) ක වෛද්‍යාධාර.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
කම්කරු කොමසාරිස්.

2010 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 – 909

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.